# ජාතික අධ්‍යාපන ආයතනය

## පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

## (පූර්ණ කාලීන 2019)

ජාතික අධ්‍යාපන අයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය මඟින් පවත්වනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**<u>පාඨමාලාව</u>**

මෙම පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව අධ්‍යාපන ආයතන කළමනාකරණය හා සංවර්ධනය කිරීමට අවශ්‍ය නායකත්ව හා කළමනාකරණ දැනුම, නිපුණතා හා ආකල්ප ලබාදීමට සම්පාදනය කර ඇත. එය න්‍යායාත්මක අධ්‍යයන සහ පර්යේෂණ නිබන්ධනයකින් යුක්ත වන අතර, ඒ සියල්ල ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කළ යුතුවේ. සියලුම සුදුසුකම්ලත් අපේක්ෂකයන් ඇතුලත්වීමේ විභාගයකට පෙනී සිටිය යුතුය.

**පාඨමාලාව පැවැත්වෙන ස්ථානය ඃ** අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක

**පාඨමාලා කාලසීමාව ඃ** පූර්ණ කාලීන - අවුරුදු එකයි (අධ්‍යයන වාර 3 කින් පැවැත්වේ) වර්ෂ 2019 ජනවාරි මස පාඨමාලාව ආරම්භ කිරීමට අපේක්ෂිතය.

**මාධ්‍යය ඃ** ඉංග්‍රීසි

**<u>අයදුම් කිරීම සඳහා සුදුසුකම්</u>**

**අයදුම් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු වේ:**

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය/විදුහල්පති සේවය/ගුරු අධ්‍යාපනඥ සේවයට අයත්වීම, පිළිගත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අධ්‍යාපන ආයතනයක ප්‍රධානියකු වීම හෝ පරිවේනාධිපති තනතුරක් හෙබවීම;

ii. පිළිගත් විශ්වවිද්‍යාලයක/ආයතනයක අධ්‍යාපනවේදී උපාධිය

<u>හෝ</u>

වෙනත් විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ පශ්චාත්උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව, පුහුණු ගුරු සහතිකය හෝ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව වැනි වෘත්තීය සුදුසුකමක් තිබීම;

iii අවම වශයෙන් අවුරුදු හතරක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම සහ ඉන් අවුරුදු දෙකක්වත් පරිපාලන හා අධීක්ෂණ කටයුතුවල නිරත ව සිටීම;

iv තෝරා ගනු ලබන අධ්‍යයන වර්ෂයේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ කිසිදු පූර්ණ කාලීන/අර්ධ කාලීන පාඨමාලාවක් <u>හෝ</u> කිසියම් වෙනත් අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරමින් නො සිටීම (2019);

v ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අදාල සියලු මූලික සුදුසුකම් සපුරා තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය**

සියළුම අයදුම්කරුවන් අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය විසින් නිගමනය කරනු ලබන ප්‍රවේශ විභාගයකට පෙනී සිටිය යුතුය. විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

I - අධ්‍යාපන කළමනාකරණය (පැය 02)

II - ඉගෙනුම් කුසලතා හා ඉංග්‍රීසි භාෂාව (පැය 1 1/2)

ප්‍රවේශ විභාගයට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පිළිතුරු සැපයිය හැකිය.

නියමිත ලකුණු මට්ටමට එළඹෙන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

**අයදුම් කරන පිළිවෙළ**

ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවියෙන් (www.nie.lk) ලබාගත හැකි ආදර්ශය අනුව ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිත වූ ඉල්ලුම් පත්‍රයක්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගිණුම් අංක 7041168 ට පාඨමාලා ප්‍රවේශ විභාග ගාස්තු රුඃ 1,250/- ක් බැර කොට ලබා ගත් ලදුපත සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන්නඃ

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය,
මීපේ හන්දිය, පාදුක්ක

ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ උඩ වම් කෙළවරේ - **PGDEM Full-Time - 2019** යනුවෙන් සඳහන් කරන්න.

ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනයඃ 2018 නොවැම්බර් 15 වේ.

**ගාස්තු**

**පාඨමාලා ගාස්තුව** ඃ රුඃ 60,000/-. ලියා පදිංචි ගාස්තුව රුඃ 1000/-

මෙම මුළු මුදල ලියාපදිංචි වන අවස්ථාවේ දී හෝ පහත සඳහන් ලෙස කොටස් දෙකකින් හෝ ගෙවිය හැකිය.

1. 50% ලියාපදිංචි වන අවස්ථාවේ දී, සහ
2. 50% ලියාපදිංචි වී මාස 06 ක් ගතවීමට පෙර

ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වුවහොත් ප්‍රවේශ විභාග ගාස්තුව ආපසු ගෙවනු නො ලැබේ.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම